# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,937/7 — 1970 දෙසැම්බර් 24 වැනි බ්‍රහස්පතින්ද — 1970.12.24**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)**


# IV වැනි කොටස — පළාත් පාලන

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 51/39.
ප.පා. දෙ/එච් බී 8/1/13.

### ගම්සභා ආඥාපනත

**54 වැනි වගන්තිය යටතේ ආඥාව**

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 54 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල පේරුව ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සභාපති දෙන් සුගතන් එදිරිසිංහ මහතා සම්බන්ධයෙන් —

(අ) අදක්ෂතාවය සහ අයථා පාලනය ;

(ආ) ගම්සභා ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම නොනවත්වාම ප්‍රතික්ෂේප කිරීම සහ ඕනෑකමින්ම පැහැර හැරීම ;

(ඇ) එම රාජකාරි කටයුතු ඉටු කිරීමේලා විෂමාචාරයෙන් කටයුතු කිරීම ; සහ

(ඈ) ගම්සභා ආඥාපනතින් පැවරුනු බලතල අනිසි ලෙස යෙදීම ;

යන මේවා ඔප්පුවන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට මා සෑහීමට පත්ව තිබෙන බැවින් එකී දෙන් සුගතන් එදිරිසිංහ මහතා එකී ගම්සභාවේ සභාපති ධුරයෙන් මේ ආඥාවෙන් ඉවත් කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970 දෙසැම්බර් මස 24 දින,
කොළඹ දීය.

12–1119


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි

1066/7—ජේ 19907—5,655 (70/12)